**ශීර්ෂය 152- වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**
**2 කොටස - එක් එක් ශිර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**1 කොටස**

**වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශිර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.41,336,420,741 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.30,898,578,088 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.9,791,851,237 ක් හා රු.645,991,416 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 ක් හා සියයට 8 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 152 | 33,184,515,741 | 23,392,664,504 | 9,791,851,237 | 29 |
| 282 | 8,151,905,000 | 7,505,913,584 | 645,991,416 | 8 |
| **එකතුව** | **41,336,420,741** | **30,898,578,088** | **10,437,842,653** | **25** |

### (ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් එකතුව රු.1,682,958,184 ක් වූ ප්‍රතිපාදන වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2013 දෙසැම්බර් 31 දිනට ලද ප්‍රතිපාදනය | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ලද ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 1,596,194,845 | 1,328,118,749 | 268,076,096 | 17 |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 18,000,000 | 11,917,708 | 6,082,292 | 34 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 10,677,339 | 7,585,617 | 3,091,722 | 29 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 58,086,000 | 52,759,968 | 5,326,032 | 09 |
| **එකතුව** | **1,682,958,184** | **1,400,382,042** | **282,576,142** | **17** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 15201 | 11,000,000 | 9,379,359 | 5,500,000 | 7,133,339 | 38,000,000 | 32,029,419 |
| 28201 | 146,000,000 | 94,284,048 | 102,000,000 | 114,550,385 | 500,000,000 | 334,941,255 |

**2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්**

**2.3.1 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.513,909 ක් වී තිබුණි.

**2.3.2 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.434,874,298 ක් විය. විස්තර පහත දැක්වේ

| **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **තැන්පත් ගිණුම් අංකය** | **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|
| | | **රු.** |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 6000/000/00/0015/0063/000 | 31,052,622 |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 6000/0000/00/0001/0022/000 | 11,222,229 |
| | 6000/0000/00/0015/0137/000 | 392,599,447 |
| **එකතුව** | | **434,874,298** |

## 2 කොටස

-----------

**එක් එක් ශීර්ෂයට අදාළ විස්තරාත්මක වාර්තාව**

---

### 1. ශීර්ෂය 152 – වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජනවාරි 27 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සෙයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (උ)

දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බැව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
| --- | --- |
| වැය ලෙජරය | මුදල් රෙගුලාසි 156(5) හා 447(2) |
| මුදල් පොත | මුදල් රෙගුලාසි 156(5) |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වැය කරන ලද රු.84,941,778 ක් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් එම අධිකාරිය වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි. එම වියදම් වෙනුවෙන් අදාල බිල්පත් හා ගෙවීම් වවුචර් අමාත්‍යාංශය විසින් ලබා ගෙන නොතිබුණු බැවින් එම වියදම් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරිමට නොහැකි විය. කෙසේ වුවද, නිරාවිය ගොවිපලට හා තඹුත්තේගම ගොවිපලට අදාළව කර තිබුණු පිළිවෙලින් රු.156,896 ක් හා රු.1,387,782 ක් එම වියදමට ඇතුළත්ව තිබුණි. එබැවින් ප්‍රතිපූර්ණය කරන ලද සම්පූර්ණ වියදම වැව්වල රොන්මඩ ඉවත් කිරිම සඳහා පමණක් යොදා ගෙන තිබුණු බව තහවුරු කර ගැනිමට නොහැකි විය.

**(ඇ) විගණන විමසුම්වලට පිළිතුරුදීම**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 11 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 05 කට 2014 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) අයවැය විචලනය**

**------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.2,045,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 14 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26 සිට සියයට 93 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඉ) අග්‍රිම ගිණුම්**

**------------**

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපාතියෙන් රු.60,500,000 ක අග්‍රිමයක් සමාලෝචිත වර්ෂයේදී බණ්ඩාරවෙල වාරිමාර්ග අධ්‍යක්ෂවරයා වෙත මුදා හැර තිබුණි. උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ 2013 වර්ෂයේදී ගිණුම් වාර්තා අනුව එම අග්‍රිමය සම්පුර්ණයෙන්ම උපයෝජනය කර තිබුණද, බණ්ඩාරවෙල වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ තොරතුරුවලට අනුව එහි වියදම රු.588,962 ක් වැඩියෙන් රු.61,088,962 ක් වී තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද ගෙවීම් වවුචර්වලට අනුව වියදම රු.58,348,499 ක් වි තිබණි. ඒ අනුව රු.2,151,501 ක වෙනසක් අනාවරණය විය. ඒ අනුව එක් එක් වාර්තා අනුව වෙනස්කම් සිදු වි තිබුණත්, ඒ සම්බන්ධයෙන් සැසදිමක් සිදු කර නොතිබුණු බව නිරික්ෂණය විය.

**(ඊ) පොදු තැන්පත් ගිණුම**

**----------------------**

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු.31,554,475 ක් වි තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ක් ඉක්මවූ රු.38,935 ක්වූ තැන්පතු 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ii)** අමාත්‍යාංශයේ පොත් හා භාණ්ඩාගාරයේ සටහන් අනුව 2013 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ රු.501,853 ක සැසඳුම් නොකළ වෙනසක් නිරික්ෂණය විය.

**(උ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 15201 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,387,400 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

**විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) විගණන විමසුම් මගින් පෙන්වා දී තිබුණු අඩුපාඩු, අක්‍රමිකතා හා අනුකූල නොවීම් නිවැරදි කිරිම පිණිස විගණන හා කළමනාකරණ කමිටුව විසින් ඵලදායි පියවරයන් ගෙන නොතිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

**අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.**

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

අමාත්‍යාංශය සතු සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) අළුත්වැඩියාවන් සඳහා 2013 වර්ෂය වන විට වාහන 15 ක් මඩාටුගම යාන්ත්‍රික වැඩපල වෙත රැගෙන ගොස් තිබුණු අතර, ඒවා අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පැවැති බැවින් එහි ගාල් කර තිබුණි. මෙම වාහන අපහරණය කිරිමට අමාත්‍යාංශය කිසිදු පියවරක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් ගෙන නොතිබුණි.

(ii) මහවැලි අධිකාරියට අයත් වසර 30 ක් පමණ පැරණි ධාවනයෙන් ඉවත් කර තිබුණු ජීප් රථයක් 2013 සැප්තැම්බර් 16 දින මඩාටුගම යාන්ත්‍රික වැඩපල වෙත අළුත්වැඩියා කිරිමට හා පින්තාරු කිරිමට භාර දී තිබුණි. 2014 මැයි 21 දින වන විටත් එහි අළුත්වැඩියාවන් නිම කර නොතිබුණි.

(iii) 2012 වර්ෂයේදී නිවත්කම් දනන් වත්කම් දියුණුව හා බල ගැන්වීමේ ව්‍යාපෘති (PEACE) අරමුදලින් රු.8,513,972 ක් වැය කර නිරාවිය ගොවිපලේ කුකුල් මඩු 05 ක් ඉදිකර තිබු නමුත් 2013 දෙසැම්බර් 31 දින වන විටත් ඒවා භාවිතයට යොදා ගෙන නොතිබීම හේතුවෙන් ඒවා වල් බිහිවෙමින් හා අභාවිතව පැවැතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2014 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වාරිමාර්ග කලමනාකරණ අංශය, උමා ඔය ව්‍යාපෘතිය, මොරගහකන්ද ව්‍යාපෘතිය, නිවත්කම් දනන් වත්කම් දියුණුව හා බල ගැන්වීමේ ව්‍යාපාතිය හා මුරුක්කන් නේවාසික ඉංජිනේරු කාර්යාලය යන ව්‍යාපාතිවල හා කාර්යාලවල වත්කම් සමීක්ෂණය කර නොතිබුණි.
- යාන්ත්‍රික වැඩපලවල් 05 ක, ගොවිපලවල් 05 ක හා කොත්මලේ පුහුණු ආයතනයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ, තොග, අමතර කොටස්, ආයුධ හා ආම්පන්න, කාර්යාල උපකරණ, යන්ත්‍රෝපකරණ, වාහන, සතුන් යනාදිය සමීක්ෂණය කර නොතිබුණි.

(ii) 2012 වර්ෂය වෙනුවෙන් සිදු කර තිබුණු සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) අමාත්‍යාංශය විසින් මිලදී ගෙන තිබුණු එකතුව රු.967,996,000 ක් වටිනා යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ හා වාහන 80 ක් සමීක්ෂණය නොකර, එකී වත්කම් භාරව කටයුතු කළ මඩාටුගම හා තඹුත්තේගම වැඩපලවල් දෙකෙහි නිලධාරීන්ගෙන් පැක්ස් මගින් ලබාගත් උපලේඛනයක් සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාවක් ලෙස ඉදිරිපත් කර තිබුණි. මෙම වත්කම් 2013 විසර්ජන ගිණුමේ ජංගම නොවන සංචලන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

---------------------------------------

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඇතැම් වත්කම් බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව/ඒකක ගණන/ප්‍රමාණය | වත්කම් ලබාදී ඇති ආයතනය | වටිනාකම | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|---|
| | | | | රු. | |
| (i) | මෝටර් වාහන | 07 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | තොරතුරු නැත | 2010 වර්ෂයේ සිට |
| | | 01 | තැපැල් අමාත්‍යාංශය | -එම- | -එම- |
| | | 03 | වනජීවි හා ගොවිජන අමාත්‍යාංශය | -එම- | -එම- |
| | | 01 | ඉංජිනේරු කාර්යයන් පිලිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | -එම- | -එම- |
| | | 02 | මහවැලි අධිකාරිය | -එම- | -එම- |
| (ii) | යන්ත්‍ර සූත්‍ර | 01 | ඔඩාවුගම/ තඹුත්තේගම යාන්ත්‍රික වැඩපල | -එම- | -එම- |
| | | 11 | දැදුරු ඔය ව්‍යාපෘතිය | -එම- | -එම- |
| | | 15 | වාර් මාර්ග ඉංජිනේරු කාර්යාලය | -එම- | -එම- |
| | | 05 | කලාප වාර්මාර්ග අධ්‍යක්ෂ කාර්යාලය | -එම- | -එම- |
| | | 01 | නිරාවිය ගොවිපල | -එම- | -එම- |
| | | 03 | උමාඔය ව්‍යාපෘතිය | -එම- | -එම- |
| | | 02 | කලාප ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය | -එම- | -එම- |
| | | 02 | උතුරු වසන්තය | -එම- | -එම- |
| (iii) | යන්ත්‍ර (වෙල්ඩින් ට්‍රාන්ස්පොමර් යන්ත්‍ර) | 04 | වාර්මාර්ග දෙපාර්තමේන්තුව | -එම- | 2013 වර්ෂයේ සිට |

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.99,318,935 ක් වූ අතර, එම ශේෂය වර්ෂයකට වඩා අඩු කාලපරිච්ඡේදයකට අදාළ විය.

## 1.6 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 139(4) හා 264(1) | 76,201,103 | උමාඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ගෙවීම් වෙනුවෙන් වවුචර්වල සඳහන් මුදල ලද බවට ආදායකයා විසින් කුවිතාන්සියක් මගින් තහවුරු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 237(ආ) | 2,143,995 | අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණු මඤ්ඤොක්කා පෙති කපන යන්ත්‍ර 02 ක්, වෙල්ඩින් ට්‍රාන්ස්ෆෝමර් 04 ක් සහ උමා ඔය බහු කාර්ය යෝජනා ක්‍රමය මගින් මිලදී ගෙන තිබුණු කාර්යාල උපකරණ තොගයක්, තොග පොතට ඇතුළත් කළ බවට වූ සහතික ගෙවීම් වවුචර්වලට අමුණා නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 272(3) | 751,357 | මොරගහකන්ද ව්‍යාපෘති කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණු ගෙවීම්වලට අදාල වවුචර් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 1.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) නල ළිං ඉදිකිරීම, භූ ජල විද්‍යා සමීක්ෂණ, ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව පරීක්ෂාව හා දැයට කිරුළ වැඩසටහනේ වියදම් කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලයට අවස්ථා 10 කදී ලබා දී තිබුණු රු.12,341,651 ක අත්තිකාරම්, බිල්පත් හා ගෙවීම් වවුචර් මගින් වියදම් තහවුරු කර නොගෙන, ජල සම්පත් මණ්ඩලය ඉදිරිපත් කළ ඉන්වොයිස්පත්

පමණක් ලබා ගෙන එම අත්තිකාරම් පියවා ගෙන තිබුණි.

(ii) නිවත්කම් දනන් වත්කම් දියුණුව හා බල ගැන්වීම (PEACE) ව්‍යාපෘතියේ 2013 පළමු අර්ධ වර්ෂය තුළ රු.2,352,000 ක් වටිනා විදුලි ජනක යන්ත්‍රයක් හා රු.22,780,500 ක් වටිනා ජල බවුසර් 06 ක් මිලදී ගෙන තිබුණු අතර, එම මිලදී ගැනීම්වල අරමුණ විගණනයට පැහැදිලි කර නොතිබුණි. මෙම වත්කම්වලින් විදුලි ජනක යන්ත්‍රය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ වූ නිරාවිය ගොවිපලට භාර දී තිබූ අතර, ජල බවුසර් 06 එම අධිකාරිය යටතේ වූ මඩාටුගම යාන්ත්‍රික වැඩපලට භාර දී තිබුණි.

(iii) නිවත්කම් දනන් වත්කම් දියුණුව හා බල ගැන්වීමේ ව්‍යාපෘතියේ (PEACE) ගිවිසුම් කාලය නිම වූ පසු එනම් 2013 දෙවන අර්ධ වර්ෂය තුළ එම ව්‍යාපෘතිය යටතේ රු.7,300,000 ක් වැය කර නිරාවිය ගොවිපල සඳහා ශීතකරණයක් සහිත පුසෝ වර්ගයේ කැබ් රියක් සහ රු.15,675,310 ක් වැය කර කිරි ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් එකකයක් සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන තිබුණි. තවද, රු.1,973,876 ක් වැය කර නිරාවිය ගොවිපලේ කිරි නිෂ්පාදනාගාරය අළුත්වැඩියා කර තිබුණි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පවතින නිරාවිය ගොවිපල නිවත්කම් දනන් වත්කම් දියුණුව හා බල ගැන්වීමේ ව්‍යාපෘතියට කිසිදු අදාලත්වයක් නැති බැවින් ඒ සඳහා ව්‍යාපෘතියෙන් වියදම් කිරීමට මතභේදාත්මක විය.

(iv) වැව් සහ වාරි පද්ධතිවල නඩත්තුව හා පුනරුත්ථාපනය වාර්මාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරෙන බැවින් ඒ සඳහා ප්‍රතිපාදන වාර්මාර්ග දෙපාර්තමේන්තුව යටතේ සැළසිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග යෝජනා පුනරුත්ථාපනය සඳහා රු.මිලියන 1,525 ක ප්‍රතිපාදන අමාත්‍යාංශ ශීර්ෂය යටතේ සළසා තිබුණි. මෙම ප්‍රතිපාදන සළසා ගැනීමේදී අමාත්‍යාංශය ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර නොතිබුණු බවද වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(v) අමාත්‍යාංශය යටතේ වලව කන්දකැටිය නමින් ගොවිපලක් පවතින බව විගණනය වෙත වාර්තා කර නොතිබුණි. එම ගොවිපලට හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පවතින නිරාවිය ගොවිපලට අමාත්‍යාංශයේ අරමුදලින් රු.64,229 ක් වැය කර මඤ්ඤොක්කා පෙති කපන යන්ත්‍ර දෙකක් ලබා දී තිබුණි.

## 1.8 අවිධිමත් ගනුදෙනු

--------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශයේ අධික්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලද වැව්වල රොන් මඩ ඉවත්

කිරීමේ ව්‍යාපෘතිය සඳහා යොදවා තිබුණු යන්ත්‍රෝපකරණවල සේවා බිලපත් පියවීම සඳහා දේශීය නියෝජිත ආයතනවලට ගෙවීමට, මොරගහකන්ද ව්‍යාපෘති ප්‍රතිපාදනවලින් රු.2,835,177 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ගංගාද්‍රෝණි කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ වෙත ලබා දී තිබුණි. මොරගහකන්ද ව්‍යාපෘති අරමුදල් මේ සඳහා යොදා ගැනීම අවිධිමත් කාර්යයක් වී තිබුණි.

(ආ) ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රමවල පුනරුත්ථාපනය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් එම වැඩසටහනට අදාළ නොවන යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම, සූක්ෂම ජල සැපයුම් පද්ධති (Micro Irrigation System) මිලදී ගැනීම, ගොඩනැගිලි අළුත්වැඩියාව, වාහන අළුත්වැඩියාව, නිරාවිය ගොවිපලේ සේවක වැටුප් ගෙවීම, කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ නඩත්තු වියදම් කිරීම, වැනි කටයුතු සඳහා රු.130,873,403 ක් වැය කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පවතින නිරාවිය ගොවිපල, මඩාටුගම යාන්ත්‍රික ඉංජිනේරු වැඩපල සහ තඹුත්තේගම යාන්ත්‍රික වැඩපලෙහි කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම ඇතුළු වෙනත් වියදම් සඳහා මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.103,309,125 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ගෙවා තිබුණි.

(ඈ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ශාක්‍යතා අධ්‍යයනය වෙනුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.12,422,667 ක් වැය කර වාහන අළුත්වැඩියාව, දුරකථන බිල්පත් ගෙවීම, පානීය ජල බෝතල් මිලදී ගැනීම, කාර්යාල උපකරණ මිලදී ගැනීම, ගොඩනැගිලි කුලී ගෙවීම, පුවත්පත් දැන්වීම් පල කිරීම, වරිපනම් බදු ගෙවීම හා නිලධාරීන්ගේ පාඨමාලා ගාස්තු පියවීම සිදු කර තිබුණි.

(ඉ) 2012 වර්ෂයේදි අමාත්‍යාංශය විසින් රාජාංගනය, නිරාවිය සහ මොරගහකන්ද ගොවිපලවල සූක්ෂම වාරි පද්ධති ස්ථාපිත කිරීම සඳහා රු.71,750,000 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 03 ක් මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පෞද්ගලික) සමාගමට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව පවරා තිබුණි.

## 1.9 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2012 වර්ෂයේ නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලැසීමේ ව්‍යාපෘතිය යටතේ ජලාශවල හා වැව්වල රොන්මඩ ඉවත් කිරීමේ කාර්යයයේ යෙදවීමට මිලදී ගත් එස්කැවේටර්, බැකෝලෝඩර්, වයිබ්‍රේටින් රෝලර් යනාදි යන්ත්‍රෝපකරණ 80 ක තොගය එම කාර්ය නිමවීමෙන් පසුව අමාත්‍යාංශයේ ව්‍යාපෘතිවල සේවයේ යෙදවීමේ හැකියාව

තිබියදී, ඒ පිළිබඳව අවධානය යොමු නොකර සමාලෝචිත වර්ෂයේදී රු.7,250,200 ක පිරිවැයක් දරමින් කුලී පදනම මත මුරුක්කන් ප්‍රධාන නේවාසික ඉංජිනේරු කාර්යාලය සඳහා යන්ත්‍රෝපකරණ මිලදී ගෙන තිබුණි.

(ආ) උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා ප්‍රධාන ඉංජිනේරු කාර්යාල වෙත ලබා දී තිබුණු අත්තිකාරම්වලින් රු.751,357 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් තඹුත්තේගම යාන්ත්‍රික වැඩපලෙහි යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ සහ සහයකයින්ගේ වැටුප් ගෙවීම සඳහා වැය කර තිබුණි.

(ඇ) අත්‍යාවශ්‍ය, ඉතා හදිසි, කල් දැමීමට නොහැකි යනාදි කරුණු දක්වමින් සමාලෝචිත වර්ෂයේදි මුදල් රෙගුලාසි 66 ප්‍රකාර අවස්ථා 08 කදී වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි. එසේ මාරු කරගෙන තිබුණු ප්‍රතිපාදනවලින් එකතුව රු.584,946,482 ක් සමාලෝචිත වර්ෂයේදි උපයෝජනය කර නොතිබුණි.

## 1.10 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 41 | 33 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 50 | 41 | 09 |
| (iii) | ද්විතියික මට්ටම | 227 | 165 | 62 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 127 | 124 | 03 |
| | **එකතුව** | **445** | **363** | **82** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 82 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ii) අනුමත සේවක සංඛ්‍යාව 445 ක් ලෙස විගණනයට තහවුරු කර තිබුණත්, 2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව එය 291 ක් වි තිබුණි. ඒ අනුව 154 ක වෙනස සම්බන්ධයෙන් පැහැදිලි කිරිමක් කර නොතිබුණි.

(iii) අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ පවතින නිරාවිය ගොවිපල, ගුරුවෙල ගොවිපල, තඹුත්තේගම යාන්ත්‍රික වැඩපල, මඩාටුගම යාන්ත්‍රික වැඩපල, කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය, උමාඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපාතිය, මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය යන ආයතනනවලට තාවකාලිකව, අනියම් හා කොන්ත්‍රාත් පදනමින් සේවකයින් බඳවා ගෙන තිබුණත්, එම සේවකයින් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරිමට අමාත්‍යාංශය අපොහොසත් වි තිබුණි. පසුගිය වර්ෂයේ එවැනි සේවකයින් 806 දෙනෙකු සේවයේ යෙදී සිටි බව නිරීක්ෂණය විය.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

**---------------------------------------------------------------------------**

අමාත්‍යාංශය විසින් 2011 හා 2012 වර්ෂයන්හි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට (මහවැලි කේන්ද්‍රයට) රියදුරන් දෙදෙනෙකු අවිධිමත් ලෙස මුදාහැර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

**-----------------------------------------------------**

අමාත්‍යාංශය විසින් වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| රියදුරු | 09 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 2010 වර්ෂයේ සිට |
| කම්කරු | 03 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 2010 වර්ෂයේ සිට |

## 2. ශීර්ෂය **282** - වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජනවාරි 12 දින වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 2.4 සිට 2.15 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව කටයුතු නිම නොකළ 2011 හා 2012 වර්ෂයන්ට අදාල එකතුව රු.735,042 ක් වටිනා ගෙවීම් වවුචර් 04 ක් අස්ථානගත වී තිබුණි.

**(ආ) විගණන විමසුම් වලට පිළිතුරු දීම**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 10 කට 2014 මාර්තු 31 දින වන විට ද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබුණු රු.29,755,904 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 36 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ක් ඉක්ම වූ රු.53,769,297 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 571 (1) ප්‍රකාර සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ඉකුත් වූ සියලු තැන්පතු පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 28201 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබූ ශේෂවල එකතුව රු.18,258,380 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් රු.637,050 ක් අයවිය යුතුව පැවතුණි. 2010 හා 2011 වර්ෂයන්හි පළාත් සභා කාර්යාලවලට මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ ණය මුදල් වාරික වශයෙන් අයවන අතර රු.180,920 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.

(iii) වැටුප් රහිත නිවාඩු මත විදේශගත වූ නිලධාරීන් 3 දෙනෙකුගෙන් රු.151,615 ක් අයවිය යුතුව පැවති අතර ඉන් නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 146,240 ක් වර්ෂ 18 ක කාලයක සිට හා එක් නිලධාරියකුගෙන් අයවිය යුතු රු.5,375 ක් වර්ෂ 12 ක් මුළුල්ලේ හිඟව පැවතුණි. නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.32,172 ක ආපදා ණය මුදල මුදල් රෙගුලාසි 113 අනුව පොත් වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව පසුගිය වසරේ වාර්තා කර තිබුණද, එම ශේෂය කපා හැරීමට හෝ පියවා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(iv) 2013 දෙසැම්බර් 31 දින වන විට මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්/සේවකයන් 186 දෙනෙකුගෙන් රු.15,147,328 ක ණය ශේෂයක් හිඟහිට තිබුණි. එම ණය ශේෂ තුළ වසර 19 ක කාලයක සිට හිඟහිටව පැවැත එන පැරණි ශේෂ විය. ණය ශේෂ පියවා ගැනීමට අදාල විශ්‍රාම වැටුප් පාරිතෝෂිතය ප්‍රමාණවත් නොවීම, විශ්‍රාම ලිපි ගොනුවල අඩුපාඩු නිසා විශ්‍රාම වැටුප් සකස් කිරීමට නොහැකි වීම, රජයේ නිවාස භාර නොදීම, විනය පරීක්ෂණ අවසන් නොවීම වැනි දෙපාර්තමේන්තුවේ පරිපාලන දුර්වලකම් මත මෙම ශේෂ පියවා ගැනීම ප්‍රමාද වී තිබුණි. පසුගිය වසරේ විගණන වාර්තාව මගින්ද මෙම තත්ත්වය පෙන්වා දී තිබුණත්, ණය ශේෂ පියවා ගැනීමේ ප්‍රගතිය පිළිබඳව විගණනයේ දී සෑහීමකට පත්විය නොහැකි විය.

(v) වැඩතහනමට ලක් වූ නිලධාරීන් 12 දෙනෙකුගෙන් එකතුව රු.519,775 ක ණය ශේෂයක් අයවිය යුතුව තිබුණු අතර එම ණය ශේෂ තුළ වසර 21 ක කාලයක සිට පැවැත එන පැරණි ණය ශේෂද විය. වැඩ තහනමට ලක්වීමට හේතු හඳුනාගෙන එම නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකරගැනීමට දෙපාර්තමේන්තුව විසින් ක්‍රියා නොකිරීම නිසා මෙම ණය ශේෂ දීර්ඝ කාලය ක් මුළුල්ලේ හිඟහිටව පැවතුණි.

(vi) සේවය හැර ගිය නිලධාරීන් 36 දෙනෙකුගෙන් රු.1,802,612 ක ණය ශේෂයක් අයවිය යුතුව තිබුණි. ඒම ණය ශේෂ තුළ වර්ෂ 18 ක් පමණ කාලයක් මුළුල්ලේ අය නොවී පවතින ණය ශේෂද පවතින බව නිරීක්ෂණය විය. මෙම ණයකරුවන්ගෙන් අයවිය යුතු ණය ශේෂ ඔවුන්ගේ දේපළවලින්, ඇපකරුවන්ගෙන් හෝ උරුමක්කරුවන්ගෙන් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කාලීනව ක්‍රියාමාර්ග නොගැනීම නිසා මෙම ණය ශේෂ දීර්ඝ කාලයක් මුළුල්ලේ හිඟහිටව පැවැතුණි.

(vii) පසුගිය වසරේ පැවති ණයකරුවන් 23 දෙනෙකුගෙන් වැඩිපුර අයකරගෙන තිබූ රු.36,886 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ ගිණුමට ඇතුළත්ව නොතිබූ අතර එම ශේෂ නිරවුල් කළ ආකාරය පිළිබඳව කිසිදු සටහනක් සැසඳුම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

(viii) කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයක හා වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 03 ක ණය ලේඛනවල කේවල ණය ශේෂ සදොස් ලෙස වැඩියෙන් දක්වා තිබුණු අතර, වර්ෂාවසාන කේවල ණය ශේෂවල හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනේ ණය ශේෂ අතර රු.496,020 ක සැසඳුම් නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

**2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**----------------------------------------**

**විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

**-----------------------------------------------------------**

2000 ජුනි 12 දිනැති අංක අයි.ඒ.අයි/2000/1 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටුව යටත් පිරිසෙන් කාර්තුවකට එක් වරක්වත් රැස්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ කමිටු රැස්වීම් තුනක් පමණක් පවත්වා තිබුණි.

**2.5 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව දෙපාර්තමේන්තුව සතු රජයේ නිවාස 267 ක පදිංචියට නිලධාරීන් ඉදිරිපත් නොවීම, අබලන්ව පැවැතීම යන හේතුන් මත දීර්ඝ කාලයක සිට භාවිතයෙන් තොරව පැවතුණි.

(ii) පදවිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අයත් තුවක්කු 47 ක් එස්. ජී. පතරොම් 83 ක් හා රයිපල් 272 ක් ප්‍රයෝජන ගැනීමකින් තොරව පැවතුණි.

(iii) කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 2 ක හා වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 7 කට අයත් වාහන හා යන්ත්‍ර 13 ක් දීර්ඝ කාලයක සිට අභාවිතව දිරාපත් වෙමින් පවතින බව 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව නිරීක්ෂණය විය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/එෆ්එස්/සමීක්ෂණ මණ්ඩල /01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 15 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්,

දෙපාර්තමේන්තුවේ වාරිමාර්ග කාර්යාල 36 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2014 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ඉහත (i) ඡේදයේ සඳහන් කාර්යාල අතරින් මහනුවර කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ, හම්බන්තොට වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ, රත්මලාන යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයේ සහ ප්‍රධාන කාර්යාලයේ ප්‍රවාහන අංශයේ 2012 වර්ෂයේදී ද භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 756(2)(අ) ප්‍රකාර සමීක්ෂණ කළ යුතු බඩු බාහිරාදිය පිළිබඳ දැනුමක් ඇති නිලධාරියෙකු සමීක්ෂණ මණ්ඩලයට ඇතුළත් විය යුතු වුවද, එවැනි නිලධාරියෙකුගේ සහයෝගය නොමැතිව දැඳුරුඔය නේවාසික ඉංජිනේරු කාර්යාලය, කළුගල් ඔය ව්‍යාපෘතිය, අම්පාර හා අනුරාධපුර කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවල පරිගණක හා උපාංග, ෆැක්ස් මැෂින් වැනි අයිතම විකිණීමට හා විනාශ කිරීමට සමීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර තිබුණි.

(iv) 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(v) රඹුක්කන් ඔය නේවාසික ඉංජිනේරු කාර්යාලයේ භාණ්ඩ නිකුත් කිරීමේ නියෝගවල දක්වා තිබුණු නිකුත් කිරීම් ප්‍රමාණයට වඩා වැඩියෙන් තොග පොත්වල නිකුත් කිරීම් සඳහන් කර තිබූ බව සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව නිරීක්ෂණය විය.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

**------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන් පරිදි දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 43 ක අනවසර පුද්ගලයින් පදිංචිවී සිටියද ඔවුන් ඉවත් කිරීම සඳහා නිත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

(ii) නිල නිවාස 58 ක් රජයේ වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන වෙත පවරා දී තිබූ බව 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල සඳහන්ව තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 635,836,768 ක් වූ අතර, එම ශේෂය වසරකට වඩා අඩු කාලපරිච්ඡේදයකට අදාල විය.

(ii) මුදල් රෙගුලාසි 94 විධිවිධානවලට පටහැනිව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු.257,021,523 ක බැරකම්වලට එළඹ තිබුණි.

(iii) 2013 වර්ෂයේ විසර්ජන ගිණුමෙන් රු.7,039,884 ක් වටිනා බැරකම් හෙළිදරව් කර නොතිබුණි.

**(ඉ) යකඩ බාජය**

මාතර නිල්වලා ගඟ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කළ විදේශ කොන්ත්‍රාත් සමාගම 1989 වර්ෂයේදී කොන්ත්‍රාත්තුව නවතා දැමූ අවස්ථාවේද මාගල්ලාගොඩ පොම්පාගාරය අසල අතහැර තිබුණු රු.මිලියන 10 කට අධික වටිනාකමකින් යුත් යකඩ බාජයක් දෙපාර්තමේන්තුව භාරයට ගෙන ආරක්ෂා කිරීමට ක්‍රියාකර තිබුණි. මේ අතර 2007 වර්ෂයේදී ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය මෙම බාජය වසර 10 ක කාලයකට මහරගම පෞද්ගලික සමාගමකට බදු දී තිබූ අතර, එකී බදු දීමට එරෙහිව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පොලීසියට කළ පැමිණිල්ලක් මත පොලීසිය විසින් බදුකරුගේ ක්‍රියාකාරකම් අත්හිටුවා තිබුණි. එයට එරෙහිව බදු ගැණුම්කරු විසින් රු.මිලියන 158 ක් වන්දියක් ඉල්ලා ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා හා මාතර දිස්ත්‍රික් ලේකම්වරයා විත්තිකරුවන් කරමින් බස්නාහිර පළාත් සිවිල් වානිජ මහා අධිකරණයේ නඩුවක් පවරා තිබුණි. ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියට නිත්‍යානුකූල හිමිකමක් නොමැති යකඩ බාජය බදුදීමට එරෙහිව දෙපාර්තමේන්තුව නීතිමය පියවර ගෙන නොතිබුණු අතර, පුද්ගලික ආයතනයක් සමඟ අත්සන් කළ බදු ගිවිසුමට නිත්‍යානුකූල පිළිගැනීමක් නොමැති බව අධිකරණය හමුවේ පැහැදිලි කිරීමටද දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 2.6 අනුකූල නොවීම්

**නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති,රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (I) මුදල් රෙගුලාසි 137 | 149,239 | කොළඹ ප්‍රධාන කාර්යාලයට හා රත්මලාන යාන්ත්‍රික වැඩපලට අදාළ ගෙවීම් වවුචර් 03 කට අනුමැතියකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (II) මුදල් රෙගුලාසි 227 | 655,550 | ප්‍රධාන කාර්යාලය, රත්මලාන යාන්ත්‍රික වැඩපල, අම්පාර වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය හා ඒ යටතේ වන වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල පුනරාවර්තන ස්වභාවයේ වියදම් සදොස් ලෙස ප්‍රාග්ධන වියදම් ලෙස වර්ගීකරණය කර ගිණුම්ගත කර තිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 2008 දෙසැම්බර් 01 දිනැති අංක 30/2008 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | 1,165,541 | නිලධාරියෙකුට හිමි උපරිම ආපදා ණය මුදල මාස 10 ක ඒකාබද්ධ වැටුපක් රු.250,000 ක් හෝ යන දෙකෙන් අඩු මුදල ගෙවිය යුතු වුවද, නිලධාරීන් හතර දෙනෙකුගේ උපරිම ණය ශේෂ රු.250,000 ඉක්මවා ආපදා ණය ගෙවා තිබුණි. |
| **(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| 2012 ඔක්තෝබර් 08 දිනැති අංක BD/A/AO/BC චක්‍රලේඛය | 5,565,022 | ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලබාගන්නා නිලධාරීන් අදාල කාර්යයට ඒවා යොදවා ගන්නේද යන්න මාස 03 කට වරක් අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් මඟින් තහවුරු කර ගත යුතු වුවත්, එවැනි තහවුරු කර ගැනීමක් සිදු කර නොතිබුණි. |
| **(ඇ) භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ** | | |
| 2013 නොවැම්බර් 18 දිනැති අංක 04/2013 දරන චක්‍රලේඛය | 198,619 | 2013 දෙසැම්බර් 31 දිනට පෙර මුදල් පොත පියවා ඉතිරි මුදල් ශේෂය බැංකුගත කළ යුතු වුවත් ත්‍රිකුණාමලය කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයේ මුදල් පොත පියවා ශේෂය බැංකුගත කර නොතිබුණි. |

## 2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබූ බව අභ්‍යන්තර විගණන වාර්තා අනුව අනාවරණය වී තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | වැඩ අවසන් කළ යුතු දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|
| | රු. | | |
| **(I) දඹුල්ල වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය** | | | |
| • දේවහුව ව්‍යාපාරයේ ප්‍රධාන ඇලේ මීටර් 11000 සිට මීටර් 12000 දක්වා වැඩි දියුණු කිරීම | 92,665 | 2013.12.25 | සඳහන් නොවේ |
| • දේවහුව ව්‍යාපාරයේ ප්‍රධාන ඇලේ මීටර් 12000 සිට මීටර් 13000 දක්වා වැඩි දියුණු කිරීම | 138,200 | 2013.12.25 | සඳහන් නොවේ |
| • දේවහුව ව්‍යාපාරයේ ප්‍රධාන ඇලේ මීටර් 13000 සිට මීටර් 14000 දක්වා වැඩි දියුණු කිරීම | 112,434 | 2013.12.25 | සඳහන් නොවේ |
| • දේවහුව ව්‍යාපාරයේ ප්‍රධාන ඇලේ මීටර් 14000 සිට මීටර් 15000 දක්වා වැඩි දියුණු කිරීම | 100,700 | 2013.12.25 | සඳහන් නොවේ |
| **(II) හිරියාල වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය** | | | |
| • බතලගොඩ ව්‍යාපෘතියේ වැලිවල දිය බස්නා ඇලේ මීටර් 750 ස්ථානයේ ගංවතුර හානි අළුත්වැඩියා කිරීම | 97,998 | 2011.12.17 | සඳහන් නොවේ |
| • හක්වටුන ඔය ව්‍යාපාරයේ වම් ඉවුර ප්‍රධාන ඇල වැඩි දියුණු කිරීම | 1,039,000 | - | සඳහන් නොවේ |
| • දියතුරේ වම් ඉවුර ප්‍රධාන ඇලෙහි කෙත් ඇල අංක 06 වැඩි දියුණු කිරීම | 102,020 | 2012.11.21 | සඳහන් නොවේ |
| • කිඹුල්වාන ඔය ව්‍යාපාරයේ රත්මලේ වැවේ වම් ඉවුර ප්‍රධාන ඇල වැඩි දියුණු කිරීම | 1,785,747 | 2012.11.02 | සඳහන් නොවේ |

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරික්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ වර්ෂය | නිම කළ යුතු වර්ෂය | 2013 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | | | රු. මිලියන | |
| යාන් ඔය | 8,700 | 2007 | 2012 | 532 | පාරිසරික ඇගයීම් වාර්තා අනුමත නොවීම |
| පහළ ඌව ජලාශය | 550 | 2005 | 2012 | 293 | මල්ලිපොත වැවේ ඉදිකිරීම් සඳහා සුදුසු පස් සපයා ගැනීමේ ගැටළු හා ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු |
| මහාගෝනා වැව | 169 | 2008 | 2016 | 7 | පාරිසරික අනුමැතිය ලැබීම ප්‍රමාද වීම |
| ගල්ඔය නවෝදය | 1,260 | 2009 | 2012 | 589 | අනෙකුත් සංරචකවල කටයුතු අවසන් කරගත නොහැකිවීම |
| මොරාණ ජලාශය | 1,700 | 2012 | 2014 | 140 | අග්‍රිම ඌනතාවය |
| ඇල්ලේ වැව | 467 | 2012 | 2013 | නැත | ඉඩම් ගැටළු |
| දීගිලි ඔය | 1,460 | 2012 | 2014 | නැත | පාරිසරික අනුමැතිය ලැබීම ප්‍රමාද වීම |
| කළුගල් ඔය | 1,481 | 2012 | 2015 | 39 | පාරිසරික ඇගයීම් වාර්තාව ප්‍රමාද වීම |
| කුඹුක්කන් ඔය | 10,000 | 2012 | 2013 | නැත | පාරිසරික අනුමැතිය ලැබීම ප්‍රමාද වීම |
| ගුරුගල් ඔය | 400 | 2009 | 2012 | 334 | අයහපත් කාලගුණික තත්ත්වය නිසා බැම්මේ අත්තිවාරම දැමීමට ප්‍රමාද වීම |
| නාපෙළඩ වතුර | 40 | 2007 | 2012 | 15 | අයහපත් කාලගුණික තත්වයන් මත පස් වැඩ කළ නොහැකි වීම හා අග්‍රිම ප්‍රමාණවත් නොවීම |
| විලකණ්ඩිය | 81 | 2011 | 2012 | 15 | අග්‍රිම ඌනතාවය |
| ගෝනගලතැන්න | 55 | 2012 | 2013 | 0.5 | වනජීවී හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අවසර නොලැබීම නිසා ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය |

**2.8 කාර්යසාධනය**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

වාර්ෂික විසර්ජන පනත මගින් ඇල්ලේ වැව, දිගීලි ඔය, කුඹුක්කන් ඔය, මහවැලි ජලය වයඹට හැරවීම, වැමැඩිල්ල ජලාශය, හේකිත්ත සුළු ගං වතුර ආරක්ෂණ යෝජනා ක්‍රමය ඉදිකිරීම, කවුඩුල්ල ඇල අදියර II දම්සෝපුර දක්වා දිගු කිරීම, මහගල්ගමුව වැව විශාල කිරීම, පෙතියාගොඩ ජල පොම්පාගාරය ඉදි කිරීම යන ව්‍යාපෘති 09 සඳහා රු. මිලියන 607 ක ප්‍රතිපාදන ලබා දී තිබුණත් ඇගයීම් වාර්තා නොතිබීම, වන්දි ගෙවීමේ හා නැවත පදිංචි කිරීමේ ගැටළු, මූලික කාර්යයන් සම්පූර්ණ නොවීම, ඉඩම් අත්පත් කර ගැනීම අවසන් නොවීම වැනි හේතූන් මත එම ව්‍යාපෘති 2013 වර්ෂයේදී ආරම්භ කර නොතිබූ අතර එම ප්‍රතිපාදන වලින් රු.මිලියන 602 ක් වෙනත් ව්‍යාපෘතිවලට මාරු කර තිබුණි.

**2.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළ යුතු ශේෂ**

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට පිලියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වෙන ගැලැපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

(අ) බැංකු ගිණුම් 19 කින් නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ රු.85,894 ක් වටිනා චෙක්පත් 30 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) අනුරාධපුරය, අම්පාර, බණ්ඩාරවෙල, මහනුවර, කුරුණෑගල, ත්‍රිකුණාමලය හා වව්නියාව යන කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවල පැවති දීර්ඝ කාලයක සිට ක්‍රියාත්මක නොවන බැංකු ජංගම ගිණුම් 07 ක් වසා දැම්මට පියවර ගෙන නොතිබුණි.

**2.10 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වු එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රඹුක්කන්ඔය ව්‍යාපෘති ප්‍රතිපාදන වලින් රු.5,493,285 ක් මහඔය රෝහලේ ප්‍රසූතිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා උපයෝගී කර ගෙන තිබුණි.

(ආ) රඹුක්කන්ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සවයට මොනරාගල, බදුල්ල, දෙහිඅත්තකන්ඩිය වැනි ප්‍රදේශවල සිට ජනතාව ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු.2,143,527 ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ගෙවා තිබූ අතර පිට පළාත්වල මහජනතාව මෙම විවෘත කිරීමේ උත්සවයට ප්‍රවාහනය කිරීමේ අරමුණ පැහැදිළි කර නොතිබුණි.

## 2.11 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ පළමුවන පන්තියට සහ වාරිමාර්ග අධ්‍යක්ෂ තනතුරුවලට විධිමත් පරිදි පත්වීම් නොලද නිලධාරීන් 12 දෙනෙකුට අංක 14/2008 සහ 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාර ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලෙස 2013 වර්ෂයේදී රු.4,539,306 ක් ගෙවා තිබුණි.

(ii) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රසිද්ධ කර ඇති කාර්යය පටිපාටික රීති මාලාවේ VII වැනි පරිච්ජේදය යටතේ අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂවරුන්, වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් (සිවිල් හා යාන්ත්‍රික), අධ්‍යක්ෂ ඉඩම් පරිහරණ, ප්‍රධාන මූල්‍ය නිලධාරී යන තනතුරු 44 ක් සඳහා පත්වීම් ලබා දීම කළ යුත්තේ රාජ්‍ය සේවා කොමිසම මඟින් වුවද වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ආවරණ අනුමැතියට යටත්ව මෙම තනතුරු සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්වීම් ලබාදී තිබුණි.

(iii) 2013 ජනවාරි 08 දිනැති අංක DMS/G2/56/15/01/VOI/.1) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාර අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 03 ක් හා ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ හා ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ විශේෂ පන්තියේ නිලධාරීන් ද අධ්‍යක්ෂ (යාන්ත්‍රික හා සිවිල් ) තනතුරු 09 ක් සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I පන්තියේ නිලධාරීන්ද පත් කළ යුතු වුවත්, සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් එකී තනතුරුවලට පත්කර තිබුණි.

## 2.12 වංචනික ස්වරූපයේ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිලිබඳ විස්තර පහත දැක්වේ.

(අ) කොළඹින් බැහැරව පිහිටි තම නිවෙස්වල සිට දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබා ගෙන ප්‍රධාන කාර්යාලයේ සේවයට වාර්තා කළ වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුට 2013 වර්ෂයේදී රු.646,388 ක මාසික ප්‍රවාහන හා ඉන්ධන දීමනා ගෙවා තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ XVII පරිච්ඡේදයේ 1 වගන්තිය ප්‍රකාරව අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට හිමිකම් නැති එහෙත් ව්‍යාජ තනතුරු නාමයන් ඇතුළත් කර අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබා ගත් තදුචිත කම්කරු සේවිකාවන් සිව් දෙනෙකු සම්බන්ධයෙන් නීතිමය පියවර නොගෙන අඛන්ඩව සේවයේ යොදවා ගනිමින් රු.604,159 ක වැටුප් ගෙවා තිබුණි. තවද, විනය ක්‍රියාමාර්ග ගැනිම වෙනුවට ඔවුන්ගේ සේවය ස්ථිර කිරීමද සිදු කර තිබුණි. මෙම කූඨ ලේඛන සකස් කිරීමේ ගනුදෙනුව නිසා රජයට සිදුව තිබුණු රු.124,436 ක අලාභය අයකර ගැනීමට සහ එයට අනුබල දුන් නිලධාරියාට එරෙහිව නිසි විනය ක්‍රියාමාර්ග ගැනීමක්ද සිදු කර නොතිබුණි.

## 2.13 විසදා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාල විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පසුවිපරම් කටයුතු නිම කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2006 | 3.1(අ) | සුගලාදේවි වැව ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු සහකාරවරයකු සිදුකර ඇති අක්‍රමිකතා |
| 2006 | 3.1(ආ) | වේලිඔය ව්‍යාපෘතිය යටතේ සිදුව ඇති අක්‍රමිකතා |
| 2006 | 2.4.1 | ව්‍යාජ ලිපිලේඛන ඉදිරිපත් කර දේපළ ණය ලබා ගැනීම |
| 2006 | 7.2(අ) | වෙහෙරගල ව්‍යාපෘතිය සඳහා කොන්ක්‍රිට් මිශ්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම |
| 2008 | 7(ඇ)(i) | වාහනයක් අනතුරට පත්වීම නිසා රු.210,000 ක අලාභයක් සිදුවීම |

## 2.14 කළමනාකරණ දුර්වලතා

නියැ දි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥාපනත සහ වරින්වර එයට සිදුකර ඇති සංශෝධන වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව ගැලපීමෙන් පසු එම ප්‍රතිව්‍යුහගත කිරීමට අදාලව නිවැරදි සංවිධාන සටහනක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේදී සිදුකළ ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල යටතේ පත්වීම් සිදු කරන ලද පහත සඳහන් නිලධාරීන් 85 දෙනෙකුට රාජකාරී ලැයිස්තු ලබා දී නොතිබුණි.

| තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|
| අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් | 03 |
| ප්‍රධාන ඉංජිනේරු | 40 |
| වාරිමාර්ග අධ්‍යක්ෂ (සිවිල්) | 36 |
| වාරිමාර්ග අධ්‍යක්ෂ (යාන්ත්‍රික) | 03 |
| ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික) | 03 |
| **එකතුව** | **85** |

## 2.15 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 408 | 265 | 143 |
| (ii) | තෘතියික මට්ටම | 180 | 30 | 150 |
| (iii) | ද්විතියික මට්ටම | 2,703 | 1,562 | 1,141 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 2,386 | 1,550 | 836 |
| | එකතුව | 5,677 | 3,407 | 2,270 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානය වන විට පැවති පුරප්පාඩු 2,270 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ii) මෙම තථ්‍ය සේවක සංඛ්‍යාවට අමතරව කොන්ත්‍රාත් පදනමින් විවිධ සේවාවල 187 දෙනෙකු සේවයේ යොදවා ඇති අතර ඊටත් අමතරව අනියම් හා තදුචිත පදනමින්ද සේවකයන් සේවයේ යොදවා ඇති නමුත් ඒ පිළිබඳව නිවැරදි සංඛ්‍යාත්මක තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

(iii) ස්ථිර අනුමත සේවක සංඛ්‍යාව 5,677 ක් ලෙස විගණනයට තහවුරු කර තිබුණද එය 4,598 ක් ලෙස 2013 වර්ෂයේ රජයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබුණි. 1,079 ක් වූ වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | සේවක වර්ගය | සේවක සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| (i) | වාරිමාර්ග ඉංජිනේරු | 05 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | සඳහන් නොවේ |
| (ii) | වාරිමාර්ග ඉංජිනේරු | 01 | -එම- | 2013.08.06 දින සිට |
| (iii) | වාරිමාර්ග ඉංජිනේරු | 01 | උමා ඔය ව්‍යාපෘතිය | 2013 ජනවාරි සිට |
| (iv) | සැලසුම් ශිල්පි | 01 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 2008 ජනවාරි සිට |
| (v) | ඉංජිනේරු සහකාර | 01 | -එම- | 2012 අප්‍රේල් සිට |
| (vi) | සැලසුම් ශිල්පි | 01 | ජනාධිපති විමර්ශන ඒකකය | 2005 මාර්තු සිට |
| (vii) | සැලසුම් ශිල්පි | 01 | -එම- | සඳහන් නොවේ. |
| (viii) | විදුලි සහකාර | 01 | -එම- | 2001 මැයි සිට |
| (ix) | විදුලි සහකාර | 01 | -එම- | 2005 මාර්තු සිට |
| (x) | සැලසුම් ශිල්පි | 01 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 2013 ජනවාරි සිට |
| (xi) | සැලසුම් ශිල්පි | 01 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2013 ඔක්තෝබර් සිට |
| (xii) | රියදුරු | 01 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | සඳහන් නොවේ. |
| (xiii) | යාන්ත්‍රික ඉංජිනේරු | 01 | -එම- | සඳහන් නොවේ. |